# පුවක්



විශ්‍රාමලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
නා.ලි. සාර්ලිස් අමරසිරි

"බන්නේ මරා මිණිදුල පබලු මුතු පට
වැන්නේ ගම'ඹු ගෙලෙ පල මල් කුමුකුවට
ගන්නේ තසිත එබැවින් නොවැද කෙළියට
යන්නේ වෙළඳගොඩ දැක මඳ කලක් සිට"

වෙළඳගොඩ ගම වටා පුවක් වැටියක් විය. එහි ගෙඩි, මල් ආදිය ගම නැමති කාන්තාවගේ ගෙළ පැළඳි මරා මිණි පබලු සහිත මුතුපට වැන්නැ'යි සැළලිහිණි සන්දේශකරු වර්ණනා කරයි.

"කරමුව සෙමෙර මල් රදරුක් අමර තුරු
රද තල් වටොරු (නවාත) පුවඟු සිරිතුරු
කුමුකුව කසට පල ගිරි එකැස් දිගු තුරු
මේ නම් වෙති දැනැ ගන්නේ කුමුකු තුරු"

පුවක් හැඳින්විය හැකි පර්යාය ශබ්ද කීපයක් ම මෙහි එයි. මෙරට පුවක්, රටපුවක්, දෝතලු, නැවි පුවක්, ලේන්තැරි ආදී පුවක් වර්ග වලින් ලේන්තැරි හා දෝතලු කුඩා ගෙඩි සහිතය. මෙරට පුවක් හා රට පුවක් මත් විය හැකිය. රුචිය වඩයි. මුවෙහි විරස බවද නසයි. විරේක ඔසුවක් හැටියට කසාය වලට පෙති පුවක් යොදා ගැනේ. ගෙඩි වලට ආලේපන කරන ඔසු සඳහා පුවක් සංයෝග කරගනු ලැබේ. පුවක් මුල් තම්බා කට සේදීමෙන් දත් මුල් සවි වේ. පුවක් පුළුස්සා ගත් අඟුරු කුඩු දත් මැදීම සඳහා පැරැන්නෝ භාවිතා කළහ.

පුවක් ගසේ කඳ පලා බඩය හා පොත්ත අස්කර හීන්ව ඉරාගත් කල වහල වල රීප්ප හැටියට භාවිතා වේ. පොල් අතු සෙවිලි කළ වහල වලට

## "රබ්බඩ අයියයි පුවක් බඩිල්ලයි"

පමණක් විට කෑමට භාවිතා වෙයි. ගාලු බුලත් විටට විශේෂයෙන් ලියන ලද කරුංකා භාවිතා වෙයි. නැවි පුවක් වලින් ගතහැකි වැඩක් නැති සේය. පුවක් පිටිය, පුවක් වත්ත, පුවක් ගහවෙල, පුවක් ඇල්ල, පුවක් දණ්ඩාව වැනි ගම්වල බහුලව පුවක් තිබෙන්නට ඇත.



පුවක් මැලසි සුරුවන් නමින්ද, මදය තරමක් මේරූ විට පෑන් තුරු කියාද, තවත් මේරු විට ගොලෑ නමින්ද, තවදුරටත් මේරු පසු සහල් ඇට කියාද, නිල් පාට එහෙත් මේරූ ගෙඩි නිලඹටු කියාද, යන්තම් කහපාට වූ කල පෑපත් නමිනුත්, අරුණුවන් පැහැය ගත්කල රබ්බඩ නමින්ද හැඳින්වේ. ලා පුවක් ලෙලිහැර කපා වේලා ගත් විට ගොලෑ හෙවත් පෙති පුවක්ය. දියේ දමා මාස කීපයක් ගියකල මඩපුවක්ය. රබ්බඩ වේලාගත් කල කරුංකාය. කෑගල්ල, රත්නපුරය වැනි දිශාවල කලක් ආර්ථිකය කෙරෙහි බලපෑ කරුංකා හා පෙති පුවක් වැනි නිශ්පාදන වලට අද තැනක් නැත. විවිධ හේතූන් නිසා පුවක් වගාවූ ඉඩම් ප්‍රමාණය අඩු වී ඇත.

ආයුර්වේද මතය අනුව පුවක් ශීතලය. රළුය. කසටය. සෙම් පිත් බැහැර කරයි. කුසගින්න දල්වයි. සමහරවිට විශේෂයෙන් පුවක් පටි භාවිතා වේ. එසේම මැටි බිත්ති සඳහා වරිච්චි බැඳීමේදී පුවක් පටි යොදා ගැනේ. ගොවියෝ තම කෙත් වතු වටා වැට ඉදි කිරීමේදී පුවක් පටි උපයෝගී කර ගත්හ. කොසු හා ඉදල් සඳහා මිටි සකස් කර ගන්නේත් පුවක් ලී වලිනි. මේරූ පුවක් ගස් වල පටි නොතෙමී තිබුණොත් දිගු කලක් නොදිරා පවතී. වෙසක් තොරණ ඉදි කිරීමත් තාවකාලික මඩු කූඩාරාම් ආදිය ඉදිකිරීමත් සඳහා අසීමිත අන්දමින් පුවක් ගස් කැපීමේ හේතුවෙන් ලංකාවේ පුවක් වගාව අභාවයට යමින් පවතින බව පෙනේ.

පුවක් මල මංගල පුෂ්පයකි. චන්දනාවේ යන අය වාහනයේ ඉදිරිපස පුවක් මලක් බැඳගෙන යාමට පුරුදුව සිටිති. පිරිත් මණ්ඩපයේ වියනට යටින් බුලත් පලුකන්, නා දලු හා පුවක් මල් කිනිති එල්ලනු ලැබේ. බලි තොවිල් ආදී සෙත් ශාන්තිකර්ම වලදී පුවක් මල් භාවිතා වේ. නූල් යන්ත්‍ර ජප කිරීම සඳහා තනන මල් බුලත් තටුවට පුවක් මල් අවශ්‍යය. බලි ඇදුරන් ආතුරයාට ආවඩා සෙත් කරන්නේ පුවක් මල් කිනිත්තෙනි.

පුවක් කොලපත පිට සුඹුලු හැර වේලාගත් විට ගෙදර දොර වැඩ සඳහා නොඑකුත් ප්‍රයෝජන ගත හැකිය. විශේෂයෙන් මුළුතැන්ගෙයි වැඩ වලට පිරිමසන් උපකරණයකි. වෙලට, පංසලට හෝ වෙනයම් ස්ථානයකට ගෙනයාම සඳහා පැරණි අය බත් ගෙඩි බැන්දේ පුවක් කොල පතේය. පැනි ආදිය එක් රැස් කර තබා ගැනීමට කොලපත් මුල උපයෝගී විය. හිඟන්නාගේ අතටද කොලපත පැමිණ තිබුණි. ගැමියාට ලිඳෙන් වතුර ගෙනැ ඒමටත් අවු වැසි වේලාවට හිස ආවරණය කර ගැනීමටත් යම් යම් දෑ දුමේ එල්ලා තැබීමටත් කොලපතින් තනා ගන්නා ගොටුව ප්‍රයෝජනවත් විය. අද පොලිතින් උර වලින් කෙරෙන කාර්යයන්ට එදා ගැමියන් කොලපත් භාවිතා කළ බව පෙනේ. පුවක් අත්තේ ඉරටු වලින් තනා ගන්නා ඉලපත ගැමි කතට ගේ දොර පිරිසිදු කර ගැනීමට අවශ්‍යම උපකරණයක් විය. හුණු වැනි දේ ඔතා තැබීමට පුවක් පරඬලය (මලේ කොපුව) උපයෝගි විය. වාණිජත්වය ඉහළින් පිළිගත් නගර බද ශිෂ්ඨාචාරයට ඉද නැමූ ගැමියා පවා අද ප්ලාස්ටික් බඳුන්වලට පුරුදු වී එම අව්‍යාජ ගැමි සංස්කෘතික ලක්‍ෂණ අමතක කර දමා ඇත.

පරිසර දූෂණය නොවන එහෙත් පරිසරයෙන්ම ලබා ගත් පුවක් වැනි ශාඛීය දේ වලින් එදිනෙදා අවශ්‍යතා පිරිමසා ගත් ගැමි සංස්කෘතියේ අව්‍යාජ ස්වභාවය අගය කරන්නට යලිත් කලක් පැමිණෙනු ඇත්ද ?

**වැඩි පිරිසක් අතරට ඔබේ දැන්වීම ගෙනයන්න**
සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න
03 8707 4604 - 0402 025 516
**email** sannasanews@gmail.com / ads.sannasa@gmail.com

ශ්‍රියානි ජයවික්‍රම මද්දුමගේ

ඉදිරි සති කීපය තුළ පැවැත්වෙන ඕස්ට්‍රේලියාවේ පළාත්පාලන මැතිවරණයේ උණුසුම ශ්‍රී ලාංකිකයන් වන අපටද දැනෙන්නට පටන්ගෙන තිබේ. ඕස්ට්‍රේලියාවේ විවිධ ප්‍රදේශ වලින් ශ්‍රී ලාංකීය නියෝජනයක් දක්නට ලැබීම මෙවර පළාත් පාලන මැතිවරණයේ



## ඕස්ට්‍රේලියානු පලාත් පාලන මැතිවරණයේ දී සුළු ජාතික නියෝජනයේ වැදගත්කම

විශේෂ ලක්ෂණයකි. ඕස්ට්‍රේලියාවේ වෙසෙන සුළු ජාතීන්ට පලාත් මට්ටමේ දේශපාලන නියෝජනයක ඇති වැදගත් කම පිළිබඳව සාකච්චා කිරීම මෙම ලිපියේ අරමුණයි.

ඕස්ට්‍රේලායාව යනු විවිධ වාර්ගික සංස්කෘතික හා භාෂාමය පසුබිම් වලින් යුත් ජන කොට්ඨාශයන්ගෙන් සමන්විත රටකි. 2006 සංඛ්‍යාලේඛණ වලට අනුව ඕස්ට්‍රේලියානුවන් ගෙන් 43.6% ක් එනම් පුද්ගලයන් 2152279 ක මාපියන් දෙදෙනාම හෝ එක් අයෙක් විදේශ වල ඉපදුණු අය වෙති. 2011 ගණනය කිරීම් වල දී එම සංඛ්‍යාව 46.8% දක්වා බහළ ගොස් ඇත .

### ඕස්ට්‍රේලියානු සමාජයේ ශ්‍රී ලාංකිකයනට හිමිවන ස්ථානය

ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික වාර්තාගත ජනගහනය 2006 දී 31480 ක් විය. එය විදේශ වල ඉපදී ඇති මුළු ඕස්ට්‍රේලියානු ජනගහනයෙන් 2.7%කි. ඕස්ට්‍රේලියාවේ බහුලව වෙසෙන විජාතිකයන් අයත් රටවල් අතරින් අපට හිමිවන්නේ 8 වන ස්තානයයි. මෑත කාලීනව සිදු වූ සංක්‍රමණයන් සළකා බලනවිට වත්මන් තත්වය මීට වඩා බෙහෙවින් වැඩි විය යුතුය.

2011 ගණනය කිරීම් වලට අනුව විදේශ වල බලදුනු ජනගහනයට අයත් වන මව් රටවල් 10න් වඩාත් වැඩි වර්ධන වේගයක් දකාවා ඇත්තේ ඉන්දියාවයි. එය 11.5% කි. ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ වර්ධන වේගය 39.7% කි. එමෙන්ම 2006 හා 2011 අතර සිංහල කතා කරන ජනගහනයේ වර්ධනය 66.4% ක් වීමද විශේෂ තත්වයකි. මේ අනුව ශ්‍රී ලාංකිකයනට ඕස්ට්‍රේලියානු ජන සමාජයේ විශේෂ තත්වයක් හිමිවන බව පැහැදිළිය.

### ඕස්ට්‍රේලියානු රජයේ වගකීම

ඕස්ට්‍රේලියාවේ වෙසෙන අප මේ රටේ සංවර්ධනයේ කොටස් කරුවෝ වෙමු. අප ද අනිකුත් ජාතීන් හා සාමූහිකව රටේ ආර්ථික ක්‍රියාවලියට විවිධ අංශ ඔස්සේ දායකත්වය සපයමු. එසේ වුවද ජන කොටසක් වශයෙන් ගත් කල අපටද අපටම ආවේනික වූ සංස්කෘතියක් භාෂාවක් හා අනන්‍යතාවක් තිබේ.

බහු සංස්කෘතික රටක වෙසෙන විවිධ ජාතීන්ගේ අවශ්‍යතා විවිධ ය. සුළු ජන කොටස් වල අවශ්‍යතා හඳුනා ගැනීමත් ඔවුන්ගේ ජීවන රටාව ඒ ඒ සංස්කෘතින්ට අනු පවත්වාගෙන යාමට අවශ්‍ය වටපිටාව සහ පහසුකම් සැළසීමත් බහු සංස්කෘතික රටක ආණ්ඩු සතු වගකීමකි.

ආගමික සංස්කෘතික හා භාෂාමය විවිධත්වය අගය කිරීම ඕස්ට්‍රේලියානු රජයේ මූලික ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන ඇත . මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීඹ සඳහා එම සංස්කෘතීන්ගේ ලක්ෂණ හඳුනාගැනීමත් එම ජනයා සහභාගි කර ගැනීමත් අවශ්‍ය වෙයි. සුලු ජන කොටස් පාලන ව්‍යුහයේ විවිධ ස්ථර වල නියෝජනය වීම වැදගත් වන්නේ එබැවිනි.

එසේ වුවුද ඕස්ට්‍රේලියානු දේශපාලනයේ සුළු ජන කොටස් වල නියෝජනය සීමිත තත්වයක පවතී. බොහෝ දුරට රටේ

38 වන පිටට